රිරගයන් හා

මෙසේ සාමූහික කැපකිරීමෙන් ඉදි කෙරෙන හුඹස ඇත්තෙන්ම සවභාව ධර්ම ක්‍රියාවලියේ සිදුවන හෝ ඉදිකරන මහඟු ඉංජිනේරු ක්‍රියා දාමයක ප්‍රතිඵලයකැයි මට සිතේ. මෙම කාර්ය භාරය අවසන කිසිම වේයකු තම මහඟු ඉදිකිරීමේ පම්පෝරිය ලොවට හඬගා කියන්නේ යයි නොසිතමි. එහෙත් මේ වේයන් විසින් ඉදිකෙරුන හුඹසට රිංගාගන්නා උරග වර්ග දස මොහොතකට සිතයොමු කරන්න. මෙසේ තැනෙන හුඹස් නානා මැදිලියේ උරගයන් තම වාසභවනය කරගන්නා අතර අවස්ථානු කූලව තම පාට වෙනස් කරගන්නා කටුස්සෝ පවුල් පිටින් මෙම හුඹස් වල පැල පදියම් වී අසරණ වේයන්ද ආහාරය බවට යොදාගනී. ගැරඬීන් සහ වෙනත් නොයෙක් මැදිලියේ විසකරු සර්පයන්ද මෙම හුඹස් වලට රිංගන පරපෝෂිතයන් අතරට වැටේ. මම හුඹස් තම වාසභවනය කර ගන්නා සර්පයන් අතරින් නාගයින් කරන එකම කාර්යය නයා ඇරීමයයි මට සිතේ.



ඔබ අනිවාර්යයෙන්ම දන්නා පරිදි හුඹස් ඉදිකරනුයේ එකතරා වේයන් වර්ගයක් විසිනි. වේයන් තම නිවස ලෙසත් තම වර්ගයාගේ දීර්ඝ කාලීන පැවැත්ම උදෙසාත් ඉදිකරන මේ හුඹස් තුලට රිංගා ගන්නා උරග වර්ගයන් බාහොමයක් වන අතර උන් සමහරකගේ පැවැත්ම දකින මට අතිවූ සිතිවිලි සමුදායකින් අතලොස්සක් ඔබ සමග බෙදා ගැනීම මෙම ලෙට සටහනේ අරමුණයි. වේයා තම වර්ගයාගේ දියුණුව උදෙසා හුඹසක් බිහිකරන අගුරු ඉතාම සිත්ගන්නා සාමූහික ක්‍රියාවලියක ප්‍රතිඵලයක් වන අතර එය ඉදිකිරීම උදෙසා යොදන ශ්‍රමය අති විශාලය. වේයා සාමූහිකව පස් අංශුවෙන් අංශුව තෝරා බේරා ගන බවුනට ඉසිලිය නොහැකි තරම් බර කරට ගෙන කරන මේ හුඹස් ඉදිකිරීම කෙතරම් කැපවීමකින් කරන්නන්දැයි ඔබ සිතා බැලුවා දැයි නොදනිමි. මෙසේ සාමූහික කැපකිරීමෙන් ඉදි කෙරෙන හුඹස ඇත්තෙන්ම සවභාව ධර්ම ක්‍රියාවලියේ සිදුවන හෝ ඉදිකෙරෙන මහඟු ඉංජිනේරු ක්‍රියා දාමයක ප්‍රතිඵලයකැයි මට සිතේ. මෙම කාර්ය භාරය අවසන කිසිම වේයකු තම මහඟු ඉදිකිරීමේ පම්පෝරිය ලොවට හඬගා කියන්නේ යයි නොසිතමි. එහෙත් මේ වේයන් විසින් ඉදිකරුන හුඹසට රිංගාගන්නා උරග වර්ග දෙස මොහොතකට සිතයොමු කරන්න. මෙසේ තැනන හුඹස් නානා මැදිලියේ උරගයන් තම වාසභවනය කරගන්නා අතර අවස්ථානු කූලව තම පාට වෙනස් කරගන්නා කටුස්සෝ පවුල් පිටින් මෙම හුඹස් වල පැල පදියම් වී අසරණ වේයන්ද ආහාරය බවට යොදාගනී. ගැරඬීන් සහ වෙනත් නොයෙක් මැදිලියේ විසකරු සර්පයන්ද මෙම හුඹස් වලට රිංගන පරපෝෂිතයන් අතරට වැටේ. මෙම හුඹස් තම වාසභවනය කර ගන්නා සර්පයන් අතරින් නාගයින් කරන එකම කාර්යය නයා ඇරීමයයි මට සිතේ. මෙසේ සවභාව ධර්මය තුල පවතින උරගයන් සහ හුඹස් අතර ඇති සහ සම්බන්ධතාවයත් එහිම ඇති ප්‍රතිවිරුද්ධතාවයත් දකින මට මිනිස් සමාජය තුලද මවන ක්‍රියාදාමයක් සිදුවන්නේදැයි සැකයක් ඇතිවීම සාර්ථක යැයි සිතේ. එපමනක් නොව මෙය දර්ශනාත්මක භෞතිකවාදයට උදාහරණයක් දොයැයි වරක භැගේ. හුඹසක් දකින බොහෝ දෙනකුට සිහියට නැගෙනුයේ එය තැනූ වේයනට වඩා එහි තුල වසන සර්පයෙකු හෝ තලගොයකු වැනි උරගයෙකු බව අප දනී. එහෙයින් හුඹස තැනීම තුලින් වේයාට ලැයබන ප්‍රචාරාත්මක හෝ ප්‍රදර්ශනාත්මක වටිනාකමක් ඇත්තේම නැත. එහෙත් හුඹස තුල අරක්ගන්නා නාගයා තම පැවත්මේ වැදගත්කමත් ප්‍රචාරාත්මක භාවයත් කේන්දු කරගන්නේ තමා බලයෙන් රිංගූ තම ශ්‍රමය බිඳුවකදු නොයෙදූ වේයා තැනූ හුඹසය. මෙයට එන්දා අනතිරත්තයේ භාෂාවෙන් පවසනවා නම් කිවයුත්තේ නයා ඇරීම කියාය. ඉදේ ජනයා තුල හුඹසට ඇති බියත් එම බිය පතුරුවාත් හරිනුයේ මෙම නයා ඇරීම ආශ්‍රය යනි.

මෙම වේයන්ගේ හුඹස් ඉදිකිරීමත් එවානුලට යම් යම් උරගයන් බලයෙන් ඇතුළවී කරන නොයකුත් ක්‍රියාදාමයනුත්, ඕස්ට්‍රේලියාවේ පිහිටවා ගන්නා නායෙකුත් ශ්‍රීලාංකික සංගම්, ආයතන, සන්නිවේදන මාර්ග නියෝජිතයන් සහ එම ආයතන සඳහා ඇප කැපවී ක්‍රියාකරණ පිරිසත් එවා තුලට රිංගන කිසියම් අවස්ථාවාදී අතලොස්සක් වූ පිරිසක් අතරත් ඇතැයි මට වැටහෙන සහ සම්බන්ධතාවයක් ඔබට විස්තර කිරීමට අවසරය දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. මෙම සංකල්පය මා මනස තුල පිලිසිඳ ගත්තේ ලඟදී කෙරුන ශ්‍රී ලාංකික කලා නිර්මාණයක ප්‍රදර්ශනය අවසන එහි නිර්මාතෘ ඇතුලු පිරිසට උපහාර දැක්වීමි දී, ග්‍රාම්‍ය බසින් පවසනවා නම් උපහාර දෙන්නා මුරුංගා අත්තේ තමා උපහාර ලබන්නාට වඩා උපහාරය පිරිනමන්නා ග්‍රාම්‍ය ගුජ්ජසා ජනක ලෙස වර්ථනා කරනු දැකීමත්, එකතරා පංසලක වෙසක් උත්සවය සඳහා නිහඬව තම ශ්‍රමය පුද කරන තරුණ කැලක් දැකීමෙන්ද ලද හැඟීමත් යයි සිතමි.

මෙහිදී අවංකවම ඉතකිී ආයතනයවලට සම්බන්ධවී තම සංස්කෘතිය සහ සභ්‍යත්වය ලොවට උලුප්පා පෙන්වන පිරිස් වලට නිගාකිරීමක් හෝ ඔවුන් අවතක්සේරුවට ලක්කිරීමක් මෙම සටහනින් නොකරන බව උදක්ම දන්වා සිටින අතර පංසලකදී හෝ වෙනත් ආයතනයකදී තම ශ්‍රමය නිහඬව පුද කරන පනී ජන කාර්යය ඉහලින් අගයන බව කිවයුතුමය. එවන් පරිත්‍යාගශීලීන් හුදෙක් හුඹස තනන රිංගන විදෙට සමානවන අතර එම ආයතනය නැමති හුඹසට රිංගා තම පම්පෝරිය හඬගා කියන පරපෝෂිත උරගයන් නම් මෙම සටහනින් කිපුනාට කමි නැත.

කලා කෘතියක ප්‍රදර්ශනය අවසන ලංකාවේ සිට පැමිණෙන රිංගායෙක් කලාකරුවන් සමග රිංගා පාරකකා පින්තූර ගන්නා පිරිස් ඔබ දැක ඇතුවාට සැකයක් නැත. රිංගා මාවුන් සමහර අයගේ එකම අරමුණ හෝ අභිප්‍රාය කලාකරුවාට ඇති ආදරය හෝ ලැදිබව මතකයේ රැක ගැනීම උනද සමහර උදවිය මෙම චාගාරෙප බුරුතු පිටින් ලංකාවට යවා තම නෑදැයන්ට තම තමන්ගේ ගේ කලාකරුවන්ට ඇති සමීප භාවය පෙන්වමින් නයා අරින බව ඔබ රිංගා නාදන්නවා විය නොහැක. මෙවැනි සිංහළ සමාජයේ තමා විසින්ම තමාවම නායකයන් බවට පත්කර ගන්නන් එසේ කරනුයේ තනිවම රිංගා නාව පවුල් පිටිනි. මොවුන් බොරු භාවිට වේයන් පසක කිබියදී හුඹසට ඒදින නාගයන් බවට සැකයක් නැත. ඔවුන්ට කලා කෘතිය ප්‍රදර්ශනයට උපකාරී වීමට තරම් ප්‍රතිභාවක් ඇද්දැයි සැක සහිත වුවද, ඒ සඳහා හැකියාවක් හෝ ප්‍රතිභාවක් ඇද්ද හෝ නැද්ද යන්න ඔවුනට ප්‍රශ්ණයක් නොවේ. අසීරුව ඇත්තේ ඔවුනට සවන් දෙන්නනට පමණි. බොහෝවිට කලා කෘතියක ප්‍රදර්ශනය අවසන මෙම නයි අරින්නන්ගේ පම්පෝරිය ඉවසීම කොතරම් අසීරුද කිවහොත් තම සාරධර්ම ගැනද නොසිතා කලාකරුවනට උපහාර කිරීමට පෙර පිටවී යන්නන් දැන් දැන් ඉහල යන බව ඔබද දැක ඇතැයි සිතමි.

ලඟදී ලංකාවට ගිය මට මිතුරකුගේ නිවසේදී වැඩි මහලු යුවලක් හමුවූ අතර මගේ පදිංචිය ඕස්ඛන් නුවර බව අසා, ඕස්ඛන් නුවර වාසය කරන කිසියම් යුවලකගේ නම් පවසා ඔවුන් හඳුනන්නෙ දැයි විමසූ කල රිංගා නාහඳුනන බව පැවසූවිට පුදුමයට පත් යුවල එසේ විය නොහැකි බව පවසා සිටියෝය. තවදුරටත් විස්තර පැවසූ එම වයස්ගත යුවල පවසා සිටියේ ඕස්ඛන් සිටින රතියා යුවල කිසියම් සංගමයක ප්‍රධාණ නිලධාරීන් බවත් ඕස්ඛන් නුවරට එන සෑම කලාකරුවකුම අනිවාර්ය යන්ම එම යුවල බැහැ දකින බවත්ය. ඔවුන් නොදන්නා කිසිම ලාංකිකයෙකු ඕස්ඛන් නුවර පමනක් නොව මුලු මහත් ඕස්ට්‍රේලියාවේම සිටිය නොහැකි බවත්ය. මේ මර උගුලින් බේරීම සඳහා මට කියන්නට සිදුවූයේ මම කිසිම ආයතනයකට සම්බන්ධ නැති බවත් හඳුනන ලාංකික පිරිස අතලොස්සක් බවත්ය. පසුව මට දැන ගන්නට ලැබුනේ එම මහලු යුවල මගේ ඕස්ට්‍රේලියාවේ පදිංචිය පිලිබඳව සැක කරන බවය.

මෙහිදී ලංකාවේ ප්‍රසිද්ධ කලාකරුවකු විදේශ සංචාරයකින් පසු පැවසූ වදන් මට සිහිවේ. ඔහුට අනුව විදේශ සංචාරයක යෙදෙන විට ඔවුනට තිබෙන ප්‍රධාණ තිසරදයක් නම් බලයෙන් කැමට ආරාධනා කරන පිරිසත් අහාර අනුභවයෙන් පසු පැය ගනන් ගායනයට, වාදනයට සහ විහිලු කථා ඇසීමට රැස් වන පිරිසත්ය. මට සිය තන පරිදි කලාකරුවන් මෙම අසීරුතාවයනට පත් කරන්නට එලි කන්නේ මෙම කලා කරුවනට ආරාධනා කර එම උත්සව සංවිධාණයට ඇප කැප වී ක්‍රියා කරන පිරිස නැතිනම් හුඹස තනන වේයන් නොව හුඹසට රිංගා ගන්නා උරගයන් පිරිසය. කලාකරුවන් සමග අමිමිත වාචාරූප සංබාවකට පෙනී සිට ඇල්බමයක් සාදා ගත් කෙනෙක් එය ලංකාවට ගෙන ගොස් නයා ඇරියද එම පුද්ගලයා හමුවූ බවවත් මතක නැති බව ලංකාවේ මිතුරකුට හමුවූ කලාකරුවකු පැවසූ කල එම කලාකරුවා සමග උරන වූ නයි අරින්නකු පිලිබඳවද ලඟදී දැනගන්නට ලැබුනි.

ඉතින් මේ නාගයන් පිලිබඳව කොතෙකුත් කථා ඇතත්, අප කණගාටු විය යුත්තේ අසරණ වේයන් බඳු තම ශ්‍රමය හා කායෙ නොමසුරුව දායද කරන පිරිසටය. මෙහිදී මා සිතට නැගෙනුයේ එක්දහස් නවසිය හැත්තෑව දශකයේ මුල භාගයේ සීමා රහිතව තම තමන්ම නඟා සිටුවීම සඳහා දේශපාලකයින් උපහාර උළළන් පවත්වද්දී හොරණ නගරයේ කම්කරුවකු වූ ජොනී තැඹැත්තා සඳහා දවස පුවත්පත අනුග්‍රහයෙන් පැවැත්වූ මහා උපහාර උළළුන් එමගින් දේශපාලන උපහාර රිංගා පරාසැරට නැවතුම් ඔසුන තැබූ අයුරුත්ය.

අනේ වේයනි නුඹලාගේ ශ්‍රමය අගයන සහ උරගයන් ගේ නයා අරීම නවතන මගක් ජොනී උපහාරය මගින් වත් අපට සොයා ගත නොහැකිද !

විජයසිරි තිලකුමාර
ඕස්ඛේන්

ශ්‍රී ලාංකික ඔබේ රියදුරු පාසල



Ravin රවින්
Professional / Patient Instructor
Easy Learning Techniques
Exceptional Pass Rate

Iyoka Driving School
Training Excellence

Tel : 94021196
Mobile : 0433028029
iyoka_ds@yahoo.com.au

ESRS Mathematics and Physics Tutoring

Quality tutoring for primary, secondary and VCE students conducted by university experienced teachers!
Secondary maths and physical science, all VCE maths units, physics and special exam preparation classes!

ESRS Rates (Individual Regular Classes):
Primary $20/hour and Secondary-VCE $30/hour

For further details visit ESRS website at:
http://esrs.vic.googlepages.com/

Contacts:
Dr. Chandra Athaudage [PhD(RMIT), MSc(Japan), BScEng(Hons)]
Mrs. Priyantha Nandasena [MEngSc(Monash), MSc, BScEng(Hons)]
Tel: (03) 9795-5070 Mobile: 0422001605
Email: c.athaudage@gmail.com or pri.nandasena@gmail.com